# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,809 - 2013 මැයි මස 03 වැනි සිකුරාදා - 2013.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | 1112 | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1112 |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* -(i) වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මුදල් පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 23 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ නිවේදන

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව වන මම 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාවේ 8 (අ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව පළාත් සභාවේ මෙතෙක් පැරණි සභා රැස්වීම් ශාලාවේ පැවති පළාත් සභා රැස්වීම් අතිගරු ජනාධිපතිතුමාණන් විසින් විවෘත කරනු ලැබූ මධ්‍යම පළාත් සභා නව පළාත් සභා සංකීර්ණයේ පිහිටි පළාත් සභා ගර්භයේ දී කැඳවනු ලබන බව මෙයින් දැනගත යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාවේ 10 (අ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව යථෝක්ත පළාත් සභා රැස්වීම වර්ෂ දෙදහස් දහතුනක් වූ අප්‍රේල් මස 05 වැනි කිවිදින පෙරවරු 10.00 ට පල්ලේකැලේ පළාත් සභා පරිපාලන සංකීර්ණයේ නව පළාත් සභා ගර්භයේ දී මා විසින් කැඳවන බව මෙයින් දැනගත යුතු ය.

ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව,
මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර.

වර්ෂ දෙදහස් දහතුනක් වූ මාර්තු මස 15 වැනි දින,
මහනුවර දී අත්සන් කරන ලදී.

05-39

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013

01. උතුරු මැද පළාත් සභාවේ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියෙහි තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා උතුරු මැද පළාතේ සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013 ජුනි මස 03 දින වේ.

02. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාව අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 පරිදි උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු මෙම තනතුර සඳහා පත්කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය උතුරුමැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. ඒ සම්බන්ධව අවසාන තීරණය ගැනීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

04. *වැටුප.-* අංක 06/2006 (IV) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වැනි පන්තිවලට අදාළ මාසික වැටුප් කාණ්ඩය අනුව රුපියල් 13,990- 10 x 145 - 11 x 170- 6 x 240- 14 x 320- රු. 23,230 වේ. රුපියල් 15,440 න් ඔබ්බට යාම සඳහා II වැනි පන්තියට උසස්වීම් ද රු. 17,310 න් ඔබ්බට යාම සඳහා I වැනි පන්තියට උසස්වීම් ද ලබා ගත යුතු ය.

05. 05.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2006 අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

5.2 2007.05.28 දිනැති අංක 7/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීණතාවක් ලබාගත යුතු ය.

5.3 පත්කරනු ලබන අය උතුරු මැද පළාතේ ඕනෑම සේවා ස්ථානයක වසර 3 ක කාලයක් අනිවාර්යයෙන් ම සේවය කිරීමට බැඳී සිටී. එම කාලය තුළ දී එම තනතුරෙන් මුදාහැරීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

06. සුදුසුකම්.- උතුරු මැද පළාත් රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ :

*(අ)* අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය ;
*(ආ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2013 ජුනි මස 03 දිනට) වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
*(ඇ)* යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.
*(ඈ)* පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථය සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර සියලුම විෂයයන්ගෙන් එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශ යටතේ විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

07. දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|
| අනුරාධපුර | 1 |
| පොළොන්නරුව | 2 |

(i) ඉහත පරිපාලන දිස්ත්‍රික්ක 2 හි ජනගහන අනුපාතයට හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 ට අදාළව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. දිස්ත්‍රික් ජනගහන අනුපාත ක්‍රමය මත වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයට අන්තර්ග්‍රහණය කරනු නොලැබේ නම් එම පුරප්පාඩු සංඛ්‍යාව පළාත තුළ යාබද දිස්ත්‍රික්කවලට නැවත බෙදා හරිනු ලැබේ.

(ii) විභාගයේදී සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

*(අ)* ස්ථිර පදිංචිය සඳහා තිබිය යුතු සුදුසුකම් :

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට උතුරු මැද පළාත තුළ (අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ) පූර්වාසන්න වසර 05 ක කාලය තුළ අනුගාමී වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර, පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(ii) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය, (එම සහතිකයේ 2 (අ) හා 2(ii) තීරයේ ඡන්ද හිමි නාමලේඛනය මගින් පදිංචිය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු වන සම්පූර්ණ නම, ඡන්ද නාම ලේඛනයේ අංකය හා ලියාපදිංචිය පිළිබඳ විස්තර සඳහන් විය යුතු වේ.)

08. *විභාග පරිපාටිය.-* බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, මෙම තරග විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් වන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (i) | භාෂා හැකියාව | 100 යි | පැය 1 1/2 යි |
| (ii) | අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

*භාෂා හැකියාව.-* මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම් මැනීම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

*අභියෝග්‍යතාව.-* මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිළියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

09. පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් (40%) ක් බැගින් අපේක්ෂයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතුවේ. තරග විභාගයෙන් බඳවා ගැනීම සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන හා අනුපාතය සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් ඉහත 06 ඡේදයේ සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

10. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් විභාගයෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කරනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරන් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා ඉහත 09 ඡේදය පරිදි සුදුසුකම් ලබා ගත යුතු ය. එසේ සුදුසුකම් ලබන අය විශේෂඥ වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබේ. විශේෂඥ වෛද්‍ය වාර්තාව පරිදි තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු වීමෙන් පසු තෝරා ගනු ලබනු ඇත.

11. *ව්‍යාජ තොරතුරු සැපයීම සම්බන්ධ දඬුවම්.-* තම සුදුසුකම් පිළිබඳ සත්‍ය තොරතුරු සැපයීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. ඔබේ අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව අපේක්ෂයෙකු නිරවද්‍යව තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. *විභාග ගාස්තු.-* සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් උතුරු මැද පළාත් සභාවට ගෙවිය යුතු වේ. විභාග ගාස්තුව රු. 600 කි. එම විභාග ගාස්තුව උතුරු මැද පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ උතුරු මැද පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන එන්සී 100 කුවිතාන්සිය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. එම විභාග ගාස්තු ගෙවිය යුත්තේ උතුරු මැද පළාත් පොදු තැන්පත් ගිණුමට බැර වන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. (මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපතේ ඡායා පිටපතක් හා අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගත යුතු වේ.)

13. *අයදුම්පත්‍රය.-*මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ - 4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්,

(අ) අංක 01 සිට 3 :4 තෙක් ඡේදයන් පළමු වන පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් දෙවන හා තුන්වන පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර තම අත් අකුරෙන්ම එය සම්පූර්ණ කර අත්සන් කළ යුතු ය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

(ඈ) ආබාධිත අයදුම්කරුවන් අයදුම්පත්‍රයේ ඉහළින් "**ආබාධිත අයදුම්කරුවෙකි**" යන්න හා ආබාධය කුමක්ද යන බව රතු පාටින් පැහැදිලිව සඳහන් කළ යුතු වේ. ආබාධිත තත්ත්වය සනාථ වන වෛද්‍ය සහතිකයේ සහතික කළ පිටපතක් අමුණා එවිය යුතු ය.

(ඉ) ඉහත 06 ඡේදය යටතේ සුදුසුකම් ලබා ඇති බවට අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

මෙම නිවේදනයට අනුව නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා ඉදිරිපත් කර නොමැති, වෙනත් ආයතන වෙත මුදල් ගෙවා ඇති, අමුණා එවා ඇති අධ්‍යාපන සහතික අනුව සුදුසුකම් සපුරා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අපැහැදිලි, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් දරා ගත යුතුවේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූලව ම සකස් කර එවිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

13.1 විභාගය පැවැත්වීමට යෝජිත නගරය හා නගර අංකය :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |

13.2 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇතිව පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර හා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එසේ වුවද යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීමෙන්/ පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වනු ඇත.

13.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද තම අයැදුම්පත (ඡායා පිටපතක් ද සමග) 2013 ජුනි මස 03 දින හෝ ඊට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පංතියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2013" යන්න හා ඔබ අදාළ වන දිස්ත්‍රික්කය ද සඳහන් කළ යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

13.4 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360 හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතිකකර නිල මුද්‍රාව තබා තිබිය යුතු ය. රාජ්‍ය සේවකයෙකු/පළාත් රාජ්‍ය සේවකයකුගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

14. විභාගයට පෙනීසිටීමට විභාගය පවත්වන දිනට යටත් පිරිසෙයින් සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ඇත. එවැනි ප්‍රවේශපත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශපත්‍ර නොලැබුණු අපේක්ෂකයින් වෙතොත් ඒ බව පහත සඳහන් විස්තර සමග විභාග කොමසාරිස් ජනරාල් වෙතින් විමසිය යුතු ය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහිතක කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් එලදායී වනු ඇත.

15. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

1. පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

16. විභාගය පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් යථා කාලයේ දී දැනුම් දෙනු ඇත. සියලුම අයදුම්කරුවන් රජයේ ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17. විභාගය පැවැත්වීම, පත්වීම් ලබාදීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳ අවසන් තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය. මෙම දැන්වීමේ ඉංග්‍රීසි, දෙමළ පරිවර්තනයන්හි අනනුකූලතාවන් සම්බන්ධයෙන් සිංහල නිවේදනය බලපැවැත්වේ.

එස්. එම්. එස්. තෙන්නකෝන්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවට,
උතුරු මැද පළාත.

2013 අප්‍රේල් මස 10 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුරය.

### ආදර්ශ අයදුම්පත්‍රය

උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2013

Open Competitive Examination for Recruitment to North Central Province Management Assistants Service Class III - 2013

(දෙන ලද කොටුව තුළ නිවැරදි සංකේතය/අංකය/අකුර පැහැදිලිව සටහන් කරන්න.)

| උතුරු මැද පළාත | 07 |
|---|---|

(කාර්යාලයීය ප්‍රායෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල -2
දෙමළ -3
ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
(භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය :
(අනුරාධපුර -19, පොළොන්නරුව - 20)

| නගරය | නගර අංකය |
|---|---|
| | |

(විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගරය සහ නගර අංකය සඳහා) විභාග නිවේදනයේ 12.1 වැනි ඡේදය බලන්න.)

1.0 පුරප්පාඩු සඳහා තරග කිරීමට විභාග නිවේදනයේ 7.0 වැනි ඡේදයට අනුකූලව ඔබ තෝරාගන්නා දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික්ක අංකය අදාළ කොටුව තුළ ලියන්න.

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය |
|---|---|
| | |

ඔබ විභාගයට පෙනී සිටින්නේ විභාග නිවේදනයේ 10 ඡේදයේ ප්‍රකාරව, ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේද? (මෙම කොටස පිරවීමට පෙර නිවේදනයේ 10 ඡේදය හොඳින් කියවෙන්නේ නම් මැනවි.)

ඔව් -1
නැත -2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : Nimal M. A. S.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී -1 පුරුෂ -0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට (2013 ජූනි 03) වයස :

අවුරුදු : මාස : දින :

3.4 දුරකථන අංකය :

4.0 4.1 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
4.3 උතුරු මැද පළාත තුළ ඔබගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය හා පදිංචිව සිටින කාල සීමාව :————.
4.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

5.0 අධ්‍යාපන සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ අවාසන දිනට සුදුසුකම් ලබා තිබිය යුතු ය.) :————.

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය :————.
ii. විභාග අංකය :————.
iii. ප්‍රතිඵල :————.

| විෂයය | සාමාර්ථ්‍යය | විෂයය | සාමාර්ථ්‍යය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර : (අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සුදුසුකම් ලබා තිබිය යුතු ය.) :————.

i. විභාගයේ වර්ෂය හා මාසය :————.
ii. විභාග අංකය :————.
iii. ප්‍රතිඵල :————.

| විෂයය | සාමාර්ථ්‍යය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

6.0 වෙනත් සුදුසුකම් ඇත්නම් :————.
7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවකට/චෝදනාවන් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.) :————.

ඔව් : නැත :

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
(ii) ලදුපත් අංකය හා දිනය :—————.
(iii) ගෙවූ මුදල :—————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.<br>(ලදු පතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වේ.) |

9.0 මෙම අයදුම්පතේ මවිසින් සපයා ඇති තොරතුරු මාගේ විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. තව ද විභාග නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසිවලට අනුව නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමේ තීරණය පිළිගැනීමට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :—————.

—————,
අයදුම්කරුගේ අත්සන.

ජාතික හැඳුනුම්පත් අංකය :—————.

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය.............................වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :—————.

අත්සන සහතික කරන අයගේ අත්සන :—————.

සහතික කරන අයගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතු ය.)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව.................................................... මයා/මිය/මෙනවිය................................. කාර්යාලයේ/ආයතනයේ................. දින සිට ................................. තනතුරක සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බවත්/නොකරන බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

සහතික කරන නිලධාරියාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

05-38

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.*
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | රු. ශ. | රු. ශ. |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිළ දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| මැයි | 2013.05.03 | සිකුරාදා | 2013.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.10 | සිකුරාදා | 2013.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.17 | සිකුරාදා | 2013.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.23 | බ්‍රහස්පතින්දා | 2013.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.31 | සිකුරාදා | 2013.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2013.06.07 | සිකුරාදා | 2013.05.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.06.14 | සිකුරාදා | 2013.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.21 | සිකුරාදා | 2013.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.28 | සිකුරාදා | 2013.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2013.07.05 | සිකුරාදා | 2013.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.12 | සිකුරාදා | 2013.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.19 | සිකුරාදා | 2013.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.26 | සිකුරාදා | 2013.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.